සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙවන වාර පරීක්ෂණය 2019

6 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 07 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති ව්‍යඤ්ජන අක්ෂර ගණන කීයද?

(1) 40 කි. (2) 18 කි. (3) 60 කි. (4) 42 කි.

02 මහාප්‍රාණ අක්ෂරයක් නොයෙදුන වචනය තෝරන්න.

(1) ධනය (2) ටකය (3) අභය (4) ඛනිජ

03 ප්‍රථම පුරුෂ, පුරුෂ ලිංග, අතීතකාල ක්‍රියා පදය තෝරන්න.

(1) දුවයි (2) දුවන්නේ ය (3) දිවුවේ ය (4) දිවුවා ය

04 අනුක්ත රූප ගන්නා නාම පදය කුමක් ද?

(1) ගැහැනියක (2) මම (3) හාවෝ (4) තොපි

05 හල් කළ හැකි ව්‍යඤ්ජන අක්ෂරය වන්නේ කුමක් ද?

(1) ඟ (2) ඹ (3) ම (4) ඳ

06 දිගු පාපිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල පිළිවෙළින් යෙදුණු වචනය තෝරන්න.

(1) පුලිඟු (2) ගුණැති (3) කුළැටි (4) බූරුවා

07 වැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය වන්නේ කුමක් ද?

(1) ප්‍රතිඵල (2) ධක්ෂිණ (3) ඡායාව (4) ස්ථාවර

LIVEWORKSHEETS

- අංක 08 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පදවලට සමානාර්ථවත් පදයක් තිත් ඉරි මත ලියන්න.

08 දිවාකර .....

09 රජතුමා .....

10 ධජය .....

- අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල දී ඇති පදවල විරුද්ධාර්ථවත් පදය තිත් ඉරි මත ලියන්න.

11 සුලබ .....

12 දොම්නස .....

13 දිළිඳු .....

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල පදවලට ගැළපෙන විශේෂණ පදයක් යොදා නැවත තිත් ඉරි මත ලියන්න.

14 අඹයක් .....

15 සිනාවෙයි .....

16 ඇඬුවාය .....

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවලට සුදුසු ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

17 සොර මුළ සැඟවී ..... (පලා ගියේය / පලා ගියහ)

18 වෛද්‍යවරිය රෝගියා පරීක්ෂා ..... (කළේය / කළාය)

19 තොපි සියලු අභ්‍යාස ..... (කරහි / කරහු)

20 පහත වාක්‍ය නිවැරදි ව පද බෙදා විරාම ලක්ෂණ සහිතව නැවත තිත් ඉරි මත ලියන්න.

බොහොමඉක්මනටආවානේදයිවිමලාකීවාය

.....

(ලකුණු 2 x 20 = 40)

LIVEWORKSHEETS